1/

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date | 2024.05.30 |
|---|---|---|---|

විත්දිත පාර්ශවය : 01. එච්. එම්. සුහාෂ් වානක බණ්ඩාර හේරත්
දෙකඳුවෙල ගෙදර, තම්මිට,
කුඹුක්වැව.

02. එම්. ඩී.ඩී. උදාර ගුණතිලක
නො. 134, තරිස්ස,
ඕපනායක.

03. ආර්. බී. ඉසුරු ලක්ෂිත
අලුත්ගම, බිඳුනුවැව,
බණ්ඩාරවෙල.

04. එන්. ශෂික කුමාර නාගහවත්ත
පදියතලාව, තැලිකඳුරාව,
පදියතලාව.

වගඋත්තර පාර්ශවය : 01. පී. ජ්.පී.අයි. ශානක කුමාර (බන්ධනාගාර නියාමක)
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා
-එළිමහන් වැඩ කඳවුර,
ශ්‍රී ලංකා බන්ධනාගාරය,
වටරැක, පාදුක්ක.

02. ආර්. ජ්.ඩී. සංජීව රාමනායක (දෙවන පෙළ ජේලර්)
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා
-එළිමහන් වැඩකඳවුර,
ලංකා බන්ධනාගාරය,
වටරැක, පාදුක්ක.

03. ඩබ්. ඩබ්. කේ. ඩෙප් මයා
බන්ධනාගාර අධිකාරී,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය හා
-එළිමහන් වැඩකඳවුර,
ශ්‍රී ලංකා බන්ධනාගාරය,
වටරැක, පාදුක්ක.




| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04.<br>இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04.<br>No.14, R.A. De Mel Mawatha, Colombo-04. | සභාපති<br>தவிசாளர்<br>Chaiman | 011-2505551 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>Email | sechrcsl@gmail.co |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

පැමිණිලි අංකය : **HRC/SUO/MOTU/22/23**

පැමිණිල්ල :

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් මාසික වැඩසටහන් පෙළගැස්මට අදාළව සිදුකරනු ලබන ස්ථානීය පරීක්ෂාවක් 2023.12.19 දින වටරැක බන්ධනාගාරයේදී සිදුකරන ලදි.

එහිදී බන්ධනාගාරයට අනුයුක්තව පවතින සුනීත පාසලේ ඉගෙනුම් ලබන තරුණ වරදකරුවන් සමඟ කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් සිදුකරන ලද සාකච්ඡාවේදී ඇතැම් බන්ධනාගාර නිලධාරීන් දරුණු ආකාරයෙන් ඔවුන්ට සලකන බව සියලුම තරුණ වරකරුවන් වෙතින් ප්‍රකාශ විය. එබැවින් ඒ පිළිබඳව වැඩිදුර විමසා බැලීමේදී ඉහත වගඋත්තරකරුවන් විසින් කිසිදු සාධාරණ හේතුවකින් තොරව අවස්ථා කිහිපයකදී ඉහත දක්වන ලද පැමිණිලිකරුවන් 04 දෙනාහට දරුණු ආකාරයෙන් පහරදී ඇති බව වාර්තා විය. තවදුරටත් ඒ පිළිබඳව විමසීමේදී අවසන්වරට එම දරුවන්ට 2023.12.16 සහ 17 යන දිනවලදී ද පහරදී ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ වූ අතර, විමර්ශන නිලධාරීන් විසින් කරුණු විමසන අවස්ථාව වන විට දරුවන්ට පහරදීමෙන් ඇතිවූ තුවාල කැළල් දැකගත හැකි විය. එබැවින් එම දරුවන් 04 දෙනාගෙන් වෙන් වශයෙන් ප්‍රකාශ සටහන් කරගත් අතර, තුවාල සිදුවී ඇති ස්ථාන ලකුණු කරගන්නා ලදි.

**පළමුවන වින්දිතයාගේ ප්‍රකාශය :**

දෙකදුවෙල ගෙදර, තම්මිට, කුඹුක්වැව ලිපිනයේ පදිංචි වයස අවුරුදු 20 ක් වූ හේරත් මුදියන්සෙලාගේ **සුභාෂ් චානක බණ්ඩාර හේරත්** යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. ඔහු සිය පියාට පහරදීම හේතුවෙන් බන්ධනාගාර ගතවී ඇති අතර, කුඹුක්කැටේ පොලිසිය විසින් 2020 දෙසැම්බර් මස දිනකදී අත්අඩංගුවට ගෙන දින 04 ක් රඳවා තබාගෙන, එම පොලිසියේ ස්ථානාධිපති විසින් එක් දිනක් පොල්ලකින් පහරදුන් බව ප්‍රකාශ කර ඇත. පසුව කුරුණෑගල මහෙස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කෑගල්ල බන්දනාගාරයට යොමුකර ඇත. එහිදී නඩුවාර දෙකකට පසු 2021.02.14 වන දින වටරැක බන්ධනාගාරයට ඇතුළත් කර ඇත. ඔහු බන්ධනාගාරගත වූ පසු අවස්ථා 03 කට වඩා පහරදීම්වලට ගොදුරුවී ඇත. මොහු ප්‍රකාශ කරන ආකාරයට 2023.12.17 දින 10.30 ට පමණ නියාමක කුමාර නිලධාරියා විසින් වාට්ටුවේ සිට ආර්.සී. අංශයට රැගෙන ගොස් පහරදී ඇත. එහිදී නියාමක කුමාර නිලධාරියා විසින් මොහුට බිත්තිය අල්ල ගන්න යැයි පරුෂ වචනයෙන් බැනවදිමින් මෝටර් සයිකල් ලොක් කරනු ලබන වයර් එකකින් කකුලේ දණිස්සෙන් පහළ කොටසට එක දිගට පහරදී ඇත. එම පරදීම සිදුවන අවස්ථාවේදී ජේලර් රාමනායක නිලධාරියා ද එම ස්ථානයේ සිට ඇත. ඔහු විසින් නඩුවක් දමා බන්ධනාගාර ගත කරන බව ප්‍රකාශ කර තර්ජනය කර ලියවිල්ලකට අත්සන් ගෙන වාට්ටුව වෙත පිටත්කර ඇත. මෙම පහරදීම පිළිබඳව 2023.12.18 දින නියාමක වල්පිට නිලධාරියා වෙත දැනුම්දී ඇති අතර, වල්පිට නිලධාරියා විසින් පී.එච්.අයි.

මහතා වෙත දැනුවත් කර ඇත. එදින සවස 4.00 - 5.00 ට පමණ පී.එච්.අයි. මහතා පැමිණ ඇති අතර, මෙම පහරදීම පිළිබඳව ඔහුව දැනුවත් කිරීමට සූදානම්වන විට නියාමක විතානෝසම් නිලධාරියා පැමිණ එම ප්‍රකාශය ලබාදීමට ඉඩ ලබාදී නොමැත. එබැවින් පී.එච්.අයි. මහතා විසින් යකඩ පෙති සහ පැනඩෝල් පෙති දෙකක් පමණක් ලබාදී පිටත්ව ගොස් ඇත. පසුව නියාමක විතානෝසම් නිලධාරියා විසින් පහරදීම පිළිබඳව කිසිවෙක්හට දැනුම්දුන්න හොත් නඩුවක් දමා බන්ධනාගාර ගත කරන බවට තර්ජනය කර ඇත.

දෙවන වින්දිතයාගේ ප්‍රකාශය :

ලිපිනය නො. 134, නරිස්ස, ඔපනායක ලිපිනයේ පදිංචි වයස අවුරුදු 17 ක් වූ මස්තියගේ දොන් දිමුතු උදාර ගුණතිලක යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. 2022 වසරේ දෙසැම්බර් මස දිනකදී සොරකම් නඩු තුනකට අත්අඩංගුවට ගෙන වේරලවත්ත පිහිටි පරිවාස රඳවුම් මධ්‍යස්ථානයේ මාස 03 ක් රඳවා තබා 2023.04.11 දින වටරක බන්ධනාගාරය වෙත ඇතුළත් කර ඇත. මෙම බන්ධනාගාරයට පැමිණි පසු යහළුවන් සමග විහිළු කරගත්තා කියලා අවස්ථා 4 ක් 5 ක් කුමාර හා රාමනායක යන නිලධාරීන්ගේ පහර කෑමට ගොදුරුවූ බව ප්‍රකාශ කර ඇත. 2023 ඔක්තෝම්බර් මස දිනකදී දහවල් 12.00 ට පමණ එළිමහනේ සිටිනා විට නියාමක කුමාර නිලධාරියා විසින් ආර්.සී. අංශයට රැගෙන ගොස් ඇත. එම අවස්ථාවේ එම අංශයේ ජේලර් රාමනායක නිලධාරියා ද සිට ඇත. පසුව එම නිලධාරීන් දෙදෙනා විසින් පරුෂ වචනයෙන් බැන වදිමින් පොල්ලකින් කොන්දට පහරදී ඇති අතර, පපුවේ නාබියට පහළින් සහ දකුණු පස ඉන ප්‍රදේශය යන ස්ථාන දෙකට යකඩ කූරක් රත් කොට තබා ඇත. නැවත නැවත පරුෂ වචනයෙන් බැන වදිමින් බිම දණ ගසා ගන්නා ලෙස ප්‍රකාශ කර ඇති අතර, එම ඉරියව්වෙන් නිවාඩි 05 ක් පමණ සිට ඇත. එහිදී රණ්ඩුවක් පිළිබඳව දිගින් දිගටම විමසමින් "ඇත්ත කියන්න" යැයි කියමින් බැන වැදී ඇත. ඒ පිළිබඳව තමා නොදන්නා බව ප්‍රකාශ කළ ද බැන වැදී ඇත. "මම වරදක් කළේ නෑ සර්, මම වරදක් කළා නම් කියනවා සර්" යනුවෙන් ප්‍රකාශ කර ඇත. එහිදී කුමාර නිලධාරියා විසින් ඔහුගේ කට දෙපැත්තෙන් තද කොට "ඇත්ත කියපන්" යැයි තදින් ප්‍රකාශ කරමින්, "උඹ ආපු දවසේ ඉඳලා කරපුවා දන්නවා" යැයි කියමින් බැන වැදී ඇත. "කියන්න සර් මම කරපු වරද කියන්න" යැයි අයැද සිටිය ද කිසිවක් ප්‍රකාශ කර නොමැත. තදින් කට දෙපැත්තෙන් අල්ලාගෙනම පිටුපසට විසිවෙන්න කකුලෙන් පපුවට ගසා ඇත. එම පහරින් විසිවී හිස බිත්තියේ වැදී ඇත. එවිට "ගහන්න එපා සර් ඔළුව රිදෙනවා" යැයි ප්‍රකාශ කර ඇත. "වතුර වුට්ටක් දෙන්න කෝ සර්" යැයි අයැද සිට ඇති අතර, "තොට වතුර දෙන්නේ නැහැ" යැයි බැන වැදී ඇත. "ගහලත් උඹ සද්ද නැතුව ඉන්නවානේ" යැයි ප්‍රකාශ කරමින් රාමනායක නිලධාරියා වම් කම්මුලට තදින් පහරක් එල්ල කර ඇත. එහිදී වේදනාව දරාගත නොහැකිව ඔහු හොඳටව හඩා ඇත. "යන්න දෙන්න සර්" යැයි අයැද ඇති අතර, "ඇත්ත විස්තරය කියනකම් යන්න දෙන්නේ නෑ" යැයි ප්‍රකාශ කර ඇත. "උඹේ නඩුව මොකද්ද" යැයි අසා ඇති අතර, නඩුවේ විස්තරය ප්‍රකාශ කළ පසු, "උඹ කුඩු ගහනවා නේද?" යැයි අසා ඇත. "මම දැකලාවත් නෑ සර්" යැයි ප්‍රකාශ කර ඇත. ඉන් පසු නැගිට්ටවා සපත්තු සහිත කකුලෙන් බඩට තදින් පහරදී

ඇත. එහිදී "මගේ බඩ කොර වුණා, ඇඹුල් රසට සෙම කටින් බිමට වැටුණා" යැයි සඳහන් කර ඇත. පසුව වතුර බාල්දියක් ගෙස එම ස්ථානය සෝදා, වතුර උගුරක් බීමට ලබාදී ඇත. පසුව වාඩි කරලා සමීපයේ ලබාගෙන ලියුමක් ලියා ඔහුගෙන් අත්සන සහ ඇඟිලි සලකුණ ගෙන ඇත. එම ලිපිය ඔහුට කියවීමට දී නැත. පසුව වාට්ටුවට ගිහින් දමා ඇත. ඔහුට කිසිම බෙහෙතක් ලබාදී ඇත. පී.එච්.අයි. මහතාගෙන් පැනඩෝල් ඉල්ලා ඇත. "උඹ හැමදාම පැනඩෝල් ගන්නවා" යැයි ප්‍රකාශ කර පැනඩෝල් ලබාදී ඇත.

පිළිස්සුණු තුවාලවලට කහ ගා ඇත.

2023.12.12 දින 11.30 ට පමණ ආර්.සී. අංශය ඉදිරිපිට දී කුමාර නිලධාරියා අතින් කොඳු නාරටියට පහරදී ඇත. පසුව අංශය ඇතුළට රැගෙන ගොස් කුඩා වයර් එකකින් අල්ලට පහරදී ඇත. එහිදී එසේ පහරදීමට කිසිදු හේතුවක් ප්‍රකාශ කර නොමැත. අත් දෙක ඉදිරියට අල්ලන්න යැයි ප්‍රකාශ කරමින් නැවත පහරදී ඇත. වාඩි වෙලා අත්දෙක එකට තද කරලා අල්ල ගන්න යැයි ප්‍රකාශ කරමින් අත්දෙක උඩ නැග ඇත. එහිදී වේදනාව දරාගත නොහැකිව කෑ කසා තිබේ. "ඒ වෙලාවේ පාර්ටි කට්ටිය ආවා. මට බැනලා එලෙව්වා. මම බයට කැක්කුමට වෙව්ලුවා. තොගෙ ඇස් දෙක උගුල්ලනවා කිව්වා" යනුවෙන් ප්‍රකාශ කර ඇත. පසුව ඔහුගේ පිටට ගසා ලියුමක් ලියවා ගෙන ඇත. එම ලිපියෙහි, "මම කවදාවත් හැදෙන්නේ නෑ. කවදාහරි මට ගහපු අයව මම මරලා දානවා" යනුවෙන් ලියවාගෙන අත්සන් ලබාගෙන ඇත. එසේ ලියවා ගත් පසු බැන වැදී තර්ජනය කර වාට්ටුව වෙත යවා ඇති අතර, කිසිදු බෙහෙතක් ලබාදී නොමැත.

**තෙවන වින්දිතයාගේ ප්‍රකාශය :**

බණ්ඩාරවෙල, බෙඳුණු වැව, අළුත්ගම ලිපිනයේ පදිංචි වයස අවුරුදු 19 ක් වූ රංන්හුම් බණ්ඩාරගේ ඉසුරු ලක්ෂිත යන අය මෙසේ ප්‍රකාශ කර ඇත. 2021.03.18 දින වැලිමඩ පොලිස් ස්ථානය මගින් වැලිමඩ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, අධිකරණය මගින් කැප්පෙටිපොළ ළමා නිවාසයට ඇතුළත් කර ඇත. පසුව එම ළමා නිවාසයෙන් පැනගොස් ඇත. පසුව මුදල් සොරකම් කර අසුවී අධිකරණය හරහා බණ්ඩාරගම බන්ධනාගාරයේ මාසයක් පමණ සිට ඇත. පසුව අධිකරණය මාර්ගයෙන් වටරැකු බන්ධනාගාරයට යොමුකර ඇත. මෙම බන්ධනාගාරයේ තනි සිරමැදිරියක සිටින බව ප්‍රකාශ කර ඇත. 2023.12.16 දින වාට්ටු බැලීමට පැමිණි කුමාර නිලධාරියා විසින් ආර්.සී. අංශයට පැමිණෙන ලෙස දන්වා තිබේ. එම ස්ථානයට ගිය පසු කමිසය ගලවන ලෙස කුමාර නිලධාරියා ප්‍රකාශ කර තිබේ. කමිසය ගැලවූ පසු පපුවේ ගසා ඇති පච්චය කව්රු විසින් සිදුකරන ලද්දක්ද යන්න පිළිබඳ ප්‍රශ්නකර ඇත. එය මීට පෙර මෙම බන්ධනාගාරයේම සිටි ළමයෙක් විසින් සිදුකරන ලද්දක් බව ප්‍රකාශ කර ඇත. එවිට බයිසිකල්වල ලොක් එක රඳවන වයර් එකකින් කොන්දට සහ වම් අතර පහර කිහිපයක් ගසා ඇත. මෙම පහරදීම පෙ.ව. 10.00 ටපමණ සිදුවූ බව ප්‍රකාශ කර ඇත. පහරදීම සිදු කළ ද කිසිදු ප්‍රතිකාරයක් ලබාදී නොමැත. පහරදීම පිළිබඳව යහළුවන්ට පමණක් ප්‍රකාශ කර ඇත.

සිර මැදිරිය පිළිබඳව සහ පහසුකම් පිළිබඳව ප්‍රකාශ කරමින්, "උදේ 5.30 ට සෙල් අරිනවා. සවස 8.00 ට වහනවා. ඊට පස්සේ වොෂ්රූම් යන්නවත් බෑ. සමහර මහත්තුරු ඇවිල්ලා බනිනවා. ජයතිලක බණ්ඩාර මහත්තයා තමයි බනින්නේ. නාන්න එක ටැංකියක් තියනවා. අපි 12 දෙනාටම නාන්න තියෙන්නේ එක බාල්දියයි. ප්‍රමාණවත් තරම් වතුර දෙන්නේ නැහැ. උදේ කෑම වලට හැමදාම බතුයි සම්බෝලයි තියෙන්නේ. සමහර දවස්වලටු කෑම කන්න බෑ." සඳහන් කරන ලදි.

**සිව්වන වින්දිතයාගේ ප්‍රකාශය :**

පදියතලාව, තැලිකඳුරාව, පදියලතාව යන ලිපිනයේ පදිංචි වයස අවුරුදු 20 ක් වූ නාගහවත්තේ ශෂික කුමාර නාගහවත්ත යන අය මෙසේ ප්‍රකාශ කරන ලදි. 2019 වසරේදී තමා ගැහැණු ළමයෙකු රැගෙන විත් පසුව දෙපාර්ශවයේම කැමැත්ත මත සිය නිවසේ පදිංචිව සිට ඇත. ගැහැණු ළමයාගේ උපන්දිනය හේතුවෙන් ඇය ඇයගේ නිවසට ඇරලවා පැමිණි පසු, තම නිවසට පදියතලාවේ පොලිසියේ නිලධාරීන් 4 දෙනෙක් 5 දෙනෙක් පැමිණ ගැහැණු ළමා කොහේද යනුවෙන් විමසමින් තමා දණ ගස්වා වේවැල් පොලුවලින් පැමිණි නිලධාරීන්ගෙන් 2 දෙනෙක් 3 දෙනෙක් පහරදී ඇත. ඉන් පසු පොලිස් ස්ථානයට රැගෙන ගොස් සිරමැදිරියේ එළියේ වාඩිකර තබා ඇත. පසුව නිවැසියන් පැමිණ විවාහයට කැමැත්ත ලබාදී ඇති බව ප්‍රකාශ කර තිබේ. මෙම පැමිණිල්ල ඔහුගේ මිතුරෙකු විසින් පෞද්ගලික තරහක් පදනම්කරගනිමින් සිදුකර ඇති බව සඳහන් කරන ලදි. එම පැමිණිල්ල හේතුවෙන් සතියක් පමණ සිරමැදිරියේ රඳවා තබාගෙන පහරදී තිබේ. පසුව දෙහිඅත්තකණ්ඩිය උසාවියට යොමුකර වසර 02 ක් පොළොන්නරුව සහ අනුරාධපුර බන්ධනාගාරයේ සිට ඇත. පසුව 2021 දෙසැම්බර් මස වටරැක බන්ධනාගාරයට යොමුකර ඇත. මෙම බන්ධනාගාරයට පැමිණි පසු අවස්ථා කිහිපයකදී පහරදීම්වලට ගොදුරු වූ බව ප්‍රකාශ කර ඇත. 2023.12.17 දින පෙ.ව.10.30 ට පමණ සෙල් එක අසලදී නියාමක කුමාර නිලධාරියා පරුෂ වචනයෙන් බැනවදිමින් බයිසිකල් ලොක් කරන කේබල් එකකින් වම් සහ දකුණු අත් දෙකේ වැලිමිටෙන් පහළට පහරවල් කිහිපයක් ගසා ඇත. "තමා බැලීමට නිවසින් කිසිවෙකුත් නොපැමිණෙන බව ප්‍රකාශ කරමින් ඉතා පරුෂ වචනයෙන් නිතර බැනවදී. තර්ජනය කරයි." යනුවෙන් ප්‍රකාශ කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

1. **පළවෙනි ආරච්චිගේ ප්‍රකාශ් ඉරෝෂන් ශානක කුමාර (නියාමක)**

වගඋත්තරකාර පළවෙනි ආරච්චිගේ ප්‍රකාශ් ඉරෝෂන් ශානක කුමාර (නියාමක) නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයන්ට අනුව, 2013 වසරේ සිට වටරැක බන්ධනාගාරයේ සේවය කරනු ලබන අතර, අධිකාරීතුමා ප්‍රධාන ජේලර් මහතා ඇතුළු ප්‍රධානීන් පවරනු ලබන ඕනෑම රාජකාරියක්

සිදුකිරීමට නියමිත බව සඳහන් කර තිබේ. 2023.12.16 සහ 17 දිනයන්හිදී පෙ.ව. 7.00 ට රාජකාරියට පැමිණ ලියාපදිංචි අංශයේ රාජකාරී භාරගෙන වාර්තා සකස්කළ බවත්, 2023.12.16 දින වානක බණ්ඩාර යන අයට නිදහස් වාර්තා සකස් කිරීමට පෙ.ව. 10.00 ට 10.30 ට පමණ ජේලර් සන්දනායක මහතාගෙන් අවසරගෙන වාට්ටුවෙන් එළියට ගෙන වාර්තාවට අවශ්‍ය තොරතුරු රැගෙන වාට්ටුව වෙත පිටත් කළ බවත් ප්‍රකාශ කර ඇත. තමා රාජකාරි කරනු ලබන ආර්.සී. අංශය තරුණ වරදකරුවන් රඳවා සිටින වාට්ටුව ආසන්නයේ පිහිටා ඇති අතර, වාට්ටුවේ ඕනෑම දෙයකට ඉක්මනටම එම ස්ථානයට යන නිලධාරියා තමා බවත්, වාට්ටුවේ කිසියම් දෙයක් සිදුවුනහොත් ළමයින් ඇවිත් කියන්නේ තමාට බවත් ප්‍රකාශ කර ඇත. තවද පැමිණිලිකරුවන් 04 දෙනා අතුරින් සුභාෂ් වානක යන අය අනෙක් ළමයින්ට වඩා වෙනස් බවත් ඔවුන් අනෙක් අය සමඟ රණ්ඩුකර ගන්නා බැවින් තමන් ඔවුන්ට සැරෙන් සිටින බවත් ඒ හේතුවෙන් මෙම චෝදනාව මට එල්ල කර ඇති බවත් මා කිසිදු අවස්ථාවක පහරදීමක් සිදුකර නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

ඉසුරු ලක්ෂිත යන අය බන්ධනාගාර ගතවන අවස්ථාවේ පච්චයක් නොතිබූ බවට ඔහුගේ මව විසින් බන්ධනාගාරයට පැමිණ ජේලර් මහතාට ප්‍රකාශ කර තිබූ බැවින් ඒ පිළිබඳව ලේඛන පරීක්ෂාකර බන්ධනාගාරයට ඇතුළුවන අවස්ථාවේ පච්චයක් නොතිබූ බැවින් ඔහුගෙන් ඒ පිළිබඳව විමසූ අතර, පච්ජයක් ගැසීම වරදක් වන බැවින් කෑගැසූ බවත් පහරදීමක් සිදුනොකළ බවත් ප්‍රකාශ කර ඇත.

දිමුතු උදාර ගුණතිලක යන අයට සිදුකරන ලද පිළිස්සීම් සහ පහරදීම පිළිබඳ චෝදනාවද වගඋත්තරකරු ප්‍රතික්ෂේපකර ඇත. පුද්ගලික තරහක් නොමැති බවත්, කෑ ගැහුවහොත් කෑගහන බවත්, ගහන්නේ වරදකට පමණක් බවත් ප්‍රකාශ කර ඇත.

2. රාමනායක ආරච්චිගේ දොන් සංජීව රාමනායක (ජේලර්)

වගඋත්තරකාර රාමනායක ආරච්චිගේ දොන් සංජීව රාමනායක (ජේලර්) නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයන්ට අනුව, 2021.07.16 දින සිට වටරැක බන්ධනාගාරයේ සේවයේ නියුතුවන අතර, රාජකාරි කටයුතු ලෙස දිවා සේවා රාජකාරි, බන්ධනාගාරය සවස වැසීමේ සහ උදෑසන ඇරීමේ රාජකාරිය, සිරකරුවන් සඳහා ලබාදෙන ආහාර බෙදාහරීමේ රාජකාරිය, කෘෂිකාර්මික කටයුතු ආදිය සිදුකරනු ලබන බව සඳහන් වේ. ඊට අමතරව බන්ධනාගාරයට අනුයුක්තව ඇති සුනීත පාසල බාර ජේලර් මහතා නොමැති දවසට එම රාජකාරීවල යොදවා තිබුණහොත් උදෑසන 7.00 ට රාජකාරියට පැමිණ පාසලට ළමයින් රැගෙනවිත් පාසලෙන් පිටත ආරක්ෂිත රාජකාරියේ යෙදී සිට නැවත පාසල අවසන් වූ පසු ළමයින් වාට්ටුව වෙත ගෙනගොස් භාරදීම සිදුරනු ලබයි.

ඉහත පැමිණිලිකරුවන් 04 දෙනාට සිදුකර ඇති පහරදීම සම්බන්ධයෙන් වගඋත්තරකරු ලබාදී ඇති ප්‍රකාශයට අනුව, 2023.12.16 දින හෝ 17 දින සිරකරුවන් ලියාපදිංචි කිරීමේ අංශයේ වානක බණ්ඩාර

යන අය තරුණ වරදකරුවන් සිර ලියාපදිංචි කිරීමේ අංශයේ (ආර්.සී.) පෙ.ව. 10.30 ට පමණ නියාමක කුමාර යන අය අසල සිටින බව දුටුබවත්, එහිදී තමා විසින් මෙම ළමයා එම ස්ථානයේ සිටීමට හේතුව විමසූ විට කුමාර නිලධාරියා විසින් චානක යන අය නිදහස්වීමට ළග හෙයින් වෛද්‍යවරයා වෙත යොමුකරන්න නිදහස් වාර්තා හදන බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. තමා විසින් චානක යන අයට තර්ජනය කිරීමක් හෝ පහරදීමක් සිදු නොකළ බවත් නියාමක කුමාර නිලධාරියා විසින් පහරදීමක් සිදුකරන බව නොදුටු බවත් ප්‍රකාශ කර ඇත. තමාට ඇති චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් 2023.09.17 සහ 18 දිනවල දිමුතු උදාර යන අයට දිනේෂ් මධුශංක, සුභාෂ් චානක, ශෂික කුමාර යන අය විසින් පහරදීමක් සිදුකර තිබූ බවත් තමා විසින් ඒ පිළිබඳව මූලික පරීක්ෂණයක් සිදුකර ළමයින්ට අවවාද කර, ළමයින් පිළිබඳව නිලධාරීන්ගේ අවධානය අවම බවට සටහන් කිරීමක් සිදුකළ බවත් එම සිදුවීමට තඩු පැවරීමක් සිදුනොකළ බවත් ප්‍රකාශ කර තිබේ. තමා කිසිදු අවස්ථාවක තරුණ වරදකරුවන්ට හෝ සිරකරුවන්ට පහරදීමක් සිදුනොකළ බව ප්‍රකාශ කර ඇත.

**සාක්ෂි විමර්ශනය කිරීම :**

1. **රංජිත් සුසන්ත වල්පිට මයා (සැරයන්)**

වටරැක බන්ධනාගාර සැරයන් රංජිත් සුසන්ත වල්පිට මයා 2024.05.08 වන දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් සටහන් කරගැනීම සඳහා කැඳවන ලදි. සුභාෂ් චානක නැමති වින්දිතයා විසින් තමාට සිදුවූ පහරදීම සම්බන්ධයෙන් මෙම නිලධාරියාට සැල කළ බව ප්‍රකාශ කර තිබීම හේතුවෙන් මෙම නිලධාරියා කැඳවන ලදි. එහිදී මෙම නිලධාරියා විසින් පහත පරිදි මෙම සිදුවීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබාදී ඇත. තමා අවස්ථා කිහිපයකදී වටරැක බන්ධනාගාරයට මාරුවීම් ලැබ අවසන්වරට 2023 වසරේ ජනවාරි මස සිට මේ දක්වා වටරැක බන්ධනාගාරයේ සේවයේ නියුතු වන අතර, තමාට පැවරී ඇති රාජකාරී ලෙස, තරුණ වරදකරුවන්ගේ අවශ්‍යතා සොයාබැලීම, ඔවුන් ක්‍රීඩා කටයුතුවලට යොමු කිරීම, ඔවුන්ගේ ගැටලු වලට උපදෙස් ලබාදීම හා අවශ්‍ය අවස්ථාවලදී ඉහළ කළමනාකරීත්වයට දැනුම්දීම කරනු ලබන බව ප්‍රකාශ කර ඇත. තමා පාසල පැවැත්වෙන අවස්ථාවේදී පාසලේ කාර්යය භාර නිලධාරී වශයෙනුත් තරුණ වරදකරුවන් රඳවා තබන අංශයේ (පැරණි අංශයේ) කාර්යය භාර නිලධාරියා වශයෙනුත් වැඩිපුර රාජකාරීවල නිරත වන බව සඳහන් කර ඇත. මෙම සිදුවීමට අදාළ වින්දිත පාර්ශවයන් 04 දෙනාම පුද්ගලිකව දන්නා බවත්, 2023.12.18 දිනයේ සුභාෂ් චානක යන අය විසින් කකුල ඉදිමිලා යනුවෙන් තමාට දැනුම්දුන් බවත්, එහිදී ඔහුගේ කකුල පරීක්ෂා කිරීමේදී කකුලේ බත්කෙණ්ඩ ඉදිමී තිබූ බැවින් එම අවස්ථාවේ වෛද්‍යවරයා නොසිටි බැවින් බන්ධනාගාර රෝහලේ මේල් නර්ස් මහතා වන දර්ශනාත් මහතාට දැනුම්දුන් බවත්, පහරදීමක් සම්බන්ධයෙන් සුභාෂ් කිසිවක් සඳහන් නොකළ බවත් ප්‍රකාශ කර ඇත.

සුභාෂ් වානක යන අයගේ කකුලේ ඉදිමීම සම්බන්ධයෙන් මේල් නර්ස් මහතා දැනුවත් කිරීම පමණක් තමා විසින් සිදු කළ බවත්,බෙහෙත් ලබාදෙන අවස්ථාවේ එම ස්ථානයේ තමා නොසිටි බිවින් නියාමක විතානෝසම් නිලධාරියා සුභාෂ් යන අයට තර්ජනය කිරීම සම්බන්ධයෙන් තමා නොදන්නා බවත් නියාමක විතානෝසම් යනු නියාමක කුමාර නිලධාරියාගේ සහයක නිලධාරියා බවත් ප්‍රකාශ කර ඇත.

මෙම සිදුවීමට අදාළ වගඋත්තර පාර්ශවයන් වන නියාමක කුමාර නිලධාරියා සහ ජේලර් රාමනායක නිලධාරියා තමා පුද්ගලිකව හඳුනන බවත්, නියාමක කුමාර නිලධාරියා සිර ලියාපදිංචි අංශයේ ද ජේලර් රාමනායක නිලධාරියා පාසලට සහ පැරණි අංශය භාරව කටයුතු කරන බවත් ප්‍රකාශ කර ඇත. මෙම නිලධාරීන් දෙදෙනා තරුණ වරදකරුවන්ට දඬුවම් කර ඇති බවටත්, තරුණ වරදකරුවන් සම්බන්ධයෙන් මානුෂීයව කටයුතු නොකරන බවටත් ආරංචි ලැබී ඇති නමුත් එවැනි සිදුවීම් තමා දැක නොමැති බවත්. මේවන විට එවැනි ගැටලු නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

වින්දිත පාර්ශවයේ කිසිවෙක් ඔවුන්ට කිසියම් පහරදීමක් සිදුවූ බව තමාට දන්වා නොමැති බවත්. මෙම සිදුවීමට අදාළව බන්ධනාගාරය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, මේවන විටත් ජේලර් රාමනායක නිලධාරියා තරුණ වරදකරුවන්ගේ අංශය වෙත රාජකාරි කටයුතු සඳහා පැමිණෙන බවත්, මීට පෙර මෙන් තරුණ වරදකරුවන්ට තදින් බැන වැදීම නතරවී ඇති බවත් නියාමක කුමාර නිලධාරියා තරුණ වරදකරුවන් සමග සම්බන්ධ වන්නේ කාර්යාලීය කටයුතු සඳහා පමණක් බවත් ප්‍රකාශ කර ඇත.

සුභාෂ් වානක යන අය සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු දක්වමින් ඔහු බන්ධනාගාරයෙන් නිදහස්වී ගිය ද 2024.05.06 වන දින ආරම්භ කළ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීමට පැමිණි බවද, නතරවීමට ස්ථානයක් නොමැතිවීම මත බන්ධනාගාර අධිකාරී විසින් මානුෂීය සලකා බලා බන්ධනාගාර සුබසාධන අංශය හරහා බන්ධනාගාර රෝහලේ නතරවීමට අවස්ථාව සලසාදුන් බවත්, එහෙත් ඊයේ දවසේ විභාගයට පෙනී සිට නොමැති අතර, අද දවසේ විභාගයට සහභාගී වූවාද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත.

2. නිශාන්ත බුද්ධප්‍රිය විතානෝසම් (නියාමක)

වටරැක බන්ධනාගාරයේ නියාමක නිශාන්ත බුද්ධප්‍රිය විතානෝසම් නිලධාරියා සම්බන්ධයෙන් සුභාෂ් වානක යන වින්දිත පාර්ශවය විසින් මෙම නිලධාරියා තමාට තර්ජනය කළ බව සිය ප්‍රකාශයේ සඳහන් කර තිබූ බැවින් 2024.05.08 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවට කැඳවා ප්‍රකාශයක් ලබාගන්නා ලදි. එම ප්‍රකාශය අනුව මෙම නිලධාරියා 2018 වසරේ සිට වටරැක බන්ධනාගාරයේ සේවය කරනු ලබන බවත්, සිරකරුවන් ලියාපදිංචි කිරීම, උසාවියට ඉදිරිපත් කිරීම, නිදහස් කිරීම ආදී රාජකාරී කටයුතු පැවරී ඇති

බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීමට සම්බන්ධ වින්දිත පාර්ශනයන් 04 දෙනාම පුද්ගලිකව හඳුනන අතර දැනට උදාර ගුණතිලක සහ ශෂික කුමාර යන අය පමණක් බන්ධනාගාරයේ සිටින බවත් ප්‍රකාශ කර ඇත. 2023.12.18 දින තමා කාර්යාලයේ රාජකාරී කටයුතු සිදුකළ බවත්, එදින සවස 5.30 පමණ වන තෙක් කාර්යාලයේ රැඳී සිටි බවත්, සුභාෂ් යන අය එම දිනය තුළ විශේෂයෙන් හමුනොවූ බවත් ප්‍රකාශ කර ඇත.

එදින සුභාෂ් යන අයට සිදුවූ පහරදීම පිළිබඳව තමා නොදන්නා බවත්, එදින මේල් නර්ස් මහතාට සුභාෂ් යන අය ඔහුට සිදුවූ පහරදීම සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නට යාමේදී මා විසින් තර්ජනය කලා යැයි දක්වනලද චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් ප්‍රකාශ කර ඇත. තමා තරුණ වරදකරුවන් සිටින වාට්ටු අසල සේවය නොකරන බවත්, දිවා ආහාරය සඳහා නිලධාරීන් මුදාහැරීමට අවශ්‍යා වූ අවස්ථාවලදී පමණක් එසේ සිදුකර ඇති බවත්, මෙම දිනයේ එවැනි කටයුත්තක් සඳහා නොගිය බවත්, එසේ ගියා නම් ලේඛන ගතව පවතින බවත් ප්‍රකාශ කර ඇත.

මෙම සිදුවීමේ වගඋත්තර පාර්ශවය ලෙස නම්කර ඇති නියාම කුමාර මහතා තමා සමග සිර ලියාපදිංචි අංශයේ රාජකාරී කටයුතු සිදුකරන අතර, ජේලර් රාමනායක මහතා සිරකරුවන් නිදහස් කිරීමේ අවස්ථාවලදී සහ උදෑසන සිරකරුවන්ට ආහාර ලබාගන්නා ඇතැම් අවස්ථාවලදී හමුවන බවත් ප්‍රකාශ කර ඇත. එම නිලධාරීන් සම්බන්ධයෙන් තරුණ වරදකරුවන්ගෙන් පැමිණිලි ඇවිත් නැති බවත්, 2023. 12.18 දිනට දවසකට හෝ දෙකකට පසු තමා විසින් සුභාෂ් යන අය බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරයා වෙත රැගෙන ගිය බවත්, එසේ රැගෙන යාමට හේතුව ඔහු නිදහස් වීමට ආසන්න බැවින් නිදහස්වීමට ආසන්න රැඳවියන් වෛද්‍යවරයාට යොමු කිරීම සිදු කරන බැවින් බව දක්වා ඇත. එම අවස්ථාවේදී ඔහුට පහරදී ඇති බව තමා නොදුටු බවත්, වෛද්‍යවරිය විසින් ඔහු පරික්ෂා කළ පසු එවැනි සටහනක් යොදා නොතිබූ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇති අතර,. සුභාෂ් යන අයට තර්ජනය කිරීම යන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවසඳහන් කර ඇත.

3. ෂේනාධීරගේ ධනංජය සෙනවිරත්න (ඖෂධ සංයෝජක)

වටරැක බන්ධනාගාර රෝහලේ ඖෂධ සංයෝජක ෂේනාධීරගේ ධනංජය සෙනවිරත්න යන නිලධාරියා 2024.05.08 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවට කැඳවා ප්‍රකාශයක් ලබාගන්නා ලදි. ඊට හේතුව වූයේ සුභාෂ් වානක සහ දිමුතු උදාර යන වින්දිතයන් විසින් බන්ධනාගාර රෝහලේ පී. එච්. නිලධාරියා සම්බන්ධයෙන් සිය ප්‍රකාශ වල සැල කර තිබීම වේ. ඒ අනුව මෙම නිලධාරියා විසින් පහත ප්‍රකාශය ලබාදෙන ලදි. තමා 2021.05.31 දින සිට බන්ධනාගාරරෝහලට අනුයුක්තව සේවය කර බවත්, පැවරී ඇති රාජකාරී වශයෙන් වෛද්‍යවරයා විසින් නිර්දේශිත ඖෂධ බන්ධනාගාර රැඳවියන්ට ලබාදීම සිදුකරන බව සඳහන් කර ඇත. රැඳවියන්ට බෙහෙත් ලබාදීම සිදුකරනු ලබන්නේ දහවල් කාලයේ සවස 3.00 වන තෙක්

රැඳවියන් බන්ධනාගාර රෝහලට යොමු කිරීම මගින් ද, රාත්‍රී කාලයේ බන්ධනාගාරය මගින් දැනුම්දීමක් ලැබුණහොත් බන්ධනාගාරයට ගොස් පරික්ෂා කර බලා රෝහලට රැගෙන ඒම සිදුකරන බව ද ප්‍රකාශ කර ඇත. රැඳවියන්ට හිසේ කැක්කුම වැනි අසනීප තත්ත්වයක් පිළිබඳ දැනුම්දීමක් ලැබුණහොත් පරික්ෂා කර බලා වෛද්‍යවරයාගේ උපදෙස් මත පැනඩෝල් ලබාදීම සිදුකරන අතර, තරුණ වරදකරුවන්ට වෛද්‍යවරයා විසින් නියම කරන ලද බෙහෙත් දිනකට උදෑසන 7.00 සහ රාත්‍රියට 7.00 වශයෙන් වෙල් දෙකක් බන්ධනාගාරයට ගොස් ඔවුන්ට ලබාදෙන බවත්, මෙවන විටත් මානසික ප්‍රතිකාර ලබන තරුණ රැඳවියන් දෙදෙනෙක් සිටින බවත් ප්‍රකාශ කර ඇත.

මෙම සිදුවීමට අදාළ වින්දිත පාර්ශවයන් 04 දෙනා පුද්ගලිකව තමා හඳුනන අතර, 2023.12.18 දින සුභාෂ් වානක යන අයට අසනීප බව දන්වා තමාට ඇමතුමක් පැමිණි බව මතක නැති බවත්, ඕනෑම අවස්ථාවක බන්ධනාගාරයෙන් ලැබෙන දැනුම්දීම මත එම අවස්ථාවේ සිටින නිලධාරියා ඒ සඳහා පිටත්වන බවත් ප්‍රකාශ කර ඇත. උදාර ගුණතිලක යන අය නිතර පැනඩෝල් ඉල්ලා සිටින්නේ ද සහ එවැනි අවස්ථාවක බැනවැදී ඇද්ද යන ප්‍රශ්නය සඳහා මෙම නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත්තේ. බොහෝ ළමයින් පැනඩෝල් ඉල්ලන බවත් මේ අවස්ථාවේදී උදාර ගුණතිලක යන අයගේ මුහුණ මතක නැති බවත්, පැනඩෝල් ඉල්ලූ පමණින් ලබා නොදෙන බවත්, අනවශ්‍ය ලෙස පැනඩෝල් භාවිතාකිරීම නුසුදුසු යැයි ළමයින්ට බැනවදින නමුත් පරුෂ වචනයෙන් කිසිදු අවස්ථාවක බැනවැදී නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

2023.12.21 දින වින්දිත පාර්ශවයන් 04 දෙනා බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරියට යොමුකරන අවස්ථාවේදී තමා එහි සිටි බවත් බාහිරට පහරදීමක් සිදුවී ඇති බවට නිරීක්ෂණය නොවූ බවත් වෛද්‍යවරිය විසින් තමා සමග පසුව හෝ එවැනි කරුණක් ප්‍රකාශ නොකල බවත් සඳහන් කර ඇති අතර, මෙම ළමයින්ට පහරදීම සම්බන්ධයෙන් ඔවුන් විසින් කිසිදු අවස්ථාවක තමාට කිසිවක් ප්‍රකාශ කර නොමැති බවත් දක්වා ඇත.

4. දොඹගම්මන මුදියන්සෙලාගේ දර්ශනාත් (හෙද නිලධාරී)

වටරැක් බන්ධනාගාර රෝහලේ හෙද නිලධාරී දොඹගම්මන මුදියන්සෙලාගේ දර්ශනාත් යන නිලධාරියා 2024.05.08 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවට කැඳවා ප්‍රකාශයක් ලබාගන්නා ලදි. ඊට හේතුව වූයේ සුභාෂ් වානක සහ දිමුතු උදාර යන වින්දිතයන් විසින් බන්ධනාගාර රෝහලේ පී. එච්. නිලධාරියා සම්බන්ධයෙන් සිය ප්‍රකාශ වල සැල කර තිබීම වේ. මෙම නිලධාරියා විසින් ලබාදෙන ලද ප්‍රකාශය අනුව රැඳවියන්ට ප්‍රතිකාර කිරීම බන්ධනාගාර රෝහලට රැගෙන විත් සිදුකරන අතර, ඇතැම් අවස්ථාවලදී බන්ධනාගාරයෙන් ලැබෙන දැනුම්දීම මත බන්ධනාගාරයට ගොස් රැඳවියන් පරික්ෂා කරන අවස්ථා ද පවතින බව සඳහන් කර ඇත. තරුණ වරදකරුවන්ට අසනීප අවස්ථාවකදී වෛද්‍යවරයා විසින් නියම කරන

ලද බෙහෙත්, වේලෙන් වේල බන්ධනාගාර රෝහලේ නිලධාරයෙක් විසින් බන්ධනාගාරය වෙත ගොස් ලබාදීම සිදුකරන බව ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීමට අදාළ වින්දිතයන් සිව් දෙනාව තමා පුද්ගලිකව හඳුනන බවත්, ඔවුන් අසනීපයක් හැර කිසිදු ගැටලුවක් තමාට ප්‍රකාශ කර නොමැති බවත් සඳහන් කර ඇත. 2023.12.18 දින සුභාෂ් යන අයට අසනීප බව වල්පිට නැමති නිලධාරියා විසින් තමාට දුරකථනයෙන් දැනුම්දුන්නාද යන්න නිශ්චිතවම මතක නැති බවත්, වල්පිට නැමති නිලධාරියා තරුණ වරදකරුවන් සම්බන්ධයෙන් ඉතා සංවේදීව කටයුතු කරන ජොෂ්ඨ නිලධාරියෙකු බවත් ප්‍රකාශ කර තිබේ. මෙම සිදුවීම වූවායැයි සඳහන් දිනයේ සුභාෂ් තමාට යමක් ප්‍රකාශ කරන්න උත්සාහ කළ අවස්ථාවේදී විතනෝසම් නිලධාරියා වැළැක්වූවායැයි යන්න පිළිගත නොහැකි බවත්, ඊට හේතුව කිසිදු අවස්ථාවක තරුණ වරදකරුවන් යමක් අප වෙත ප්‍රකාශ කිරීමට යන අවස්ථාවක කිසිදු නිලධාරියෙක් විසින් එය වළක්වා නැති බවත්, සුභාෂ්ට එදින එම සිදුවීම ප්‍රකාශ කළ නොහැකි වුවත් පසුව හෝ ප්‍රකාශ කිරීමට අවකාශ පැවති බවත් ප්‍රකාශ කර ඇති අතර, මෙවැනි සිදුවීමක් වූ බවට හෝ මෙම දිනය හෝ මතක නොමැති බව ප්‍රකාශ කර තිබේ.

සුභාෂ් වාතක යන අය සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු දක්වමින් ඔහු බන්ධනාගාරයෙන් නිදහස්වී ගිය ද 2024.05.06 වන දින ආරම්භ කළ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීමට පැමිණි බවද, නතරවීමට ස්ථානයක් නොමැතිවීම මත බන්ධනාගාර අධිකාරී විසින් මානුෂීය සලකා බලා බන්ධනාගාර සුබසාධන අංශය හරහා බන්ධනාගාර රෝහලේ නතරවීමට අවස්ථාව සලසාදුන් බවත්, එහෙත් ඊයේ දවසේ විභාගයට පෙනී සිට නොමැති බව නිලධාරියෙකු මාර්ගයෙන් දැනගත් බවත්, අද දවසේ විභාගයට සහභාගී වූවාද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කර ඇත.

බන්ධනාගාර අධිකාරීගේ කරුණු දැක්වීම :

වටරැක බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරී වශයෙන් කටයුතු කරනු ලබන ඩබ්.ඩබ්.කේ. ඩෙජ් මහතා විසින් 2023.12.29 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකරන ලද ලිපියෙහි මෙසේ සඳහන් කර ඇත. මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ගේ දැනුම්දීම මත අදාළ නේවාසිකයන් 04 දෙනා 2023.12.20 දින අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ ද, අධිකරණ වෛද්‍යවරයාගේ දැනුම්දීම මත 2023.12.21 දින අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කිරීමට කටයුතු කරන ලදි. තවද නේවාසිකයන් 04 දෙනාට පහරදීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීමට ජේලර් ඩබ්. ජ්. ඩී. සුදාරක නිලධාරියා වෙත පැවරූ අතර, එම නිලධාරියා විසින් අතුරු වාර්තාවක් ලබාදෙමින් ආයතනයේ නිලධාරීන් 10 දෙනෙක්ගෙන් සහ සුනීත පාසලේ විදුහල්පති ඇතුළු ගුරුවරුන්ගෙන් හා අදාළ නේවාසිකයින් ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවත්, විමර්ශන කටයුතු ඉදිරියට පවත්වාගෙන යන බවත් සඳහන් වේ. එමෙන්ම

අදාළ සිද්ධිගත කරුණ සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමා දැනුවත් කිරීමෙන් පසු එතුමාගේ නියෝගය පරිදි බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ II පෙළ ජේලර් එම්.එල්. පෙරේරා හා II පෙළ ජේලර් එම්.එල්.ආර්.එස්. නවාංජන යන නිලධාරීන් යොදවා විමර්ශනයක් ආරම්භ කර ඇති බව සඳහන් වේ. තවද වටරැක බන්ධනාගාරය මගින් සිදුකරන මූලික විමර්ශන අනුව ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැමිණිල්ල සනාථ කිරීම :

මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් 2023.12.19 දින වටරැක බන්ධනාගාරයේ සුනීත පාසලේ අධ්‍යාපනය ලබන දරුවන් 12 දෙනා සමඟ සිදුකරන ලද සාකච්ඡාවේදී අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් වැඩිදුර විමසීම් සිදුකර ඇත. එහිදී ඉහත නම් සඳහන් දරුවන් 04 දෙනාට, 1 සහ 2 යන වගඋත්තර පාර්ශවයන් විසින් පහරදීම හා පහරදීමට අනුබලදීම, තර්ජනය කිරීම සිදුකර ඇති බව අගතියටපත් පාර්ශවයන් විසින් ප්‍රකාශකර ඇත. මෙම දරුවන් සමඟ සාකච්ඡාව සිදුකරන අතරතුර අදාළ පහරදීම් පිළිබඳව නිරීක්ෂණය කළ අතර, දරුවන් 04 දෙනාට පහරදුන් තුවාළ කැළැල් ඒවන විටත් දැකගත හැකිවූ අතර, ඇතැම් තුවාළ කැළැල් මැකී ගොස් තිබුණි.

ඒ අනුව සුහාෂ් චානක යන අයගේ කකුල් දෙකෙහි පිටුපස දණහිසෙන් පහළ කොටසේ තැළුම් පහරවල් 03 බැගින් 06ක් දැකගත හැකි වූ අතර, කකුල ඉදිමී තැළුම් පහරවල් දම් පැහැයට හැරී තිබූ බව නිරීක්ෂණය විය.

දිමුතු උදාර යන අයගේ පපුවේ නාබියට ඉහළින් සහ වම් පස ඉන ප්‍රදේශයේ ස්ථානයක පිළිස්සුම් තුවාල කැළැල් දෙකක් දැකගත හැකි වූ අතර, දකුණු අතේ වැළම්ට අසල තැලීම් පහරක් ඉදිමී තිබෙනු දැකගත හැකි විය.

ඉසුරු ලක්ෂිත යන අයගේ පටුපස ඉන ප්‍රදේශයේ දකුණු පැත්තේ සෙන්ටිමීටර් 5 පමණ තැලීම් පහරක් දම්පාට වී තිබෙනු දැකගත හැකි විය.

ශශික කුමාර යන අයගේ වම් අතේ ඉදිරිපස වැලම්ටට පහළින් එක් තැලීම් සලකුණක් ද දකුණු අතේ වැලම්ටට ඉහළින් සහ පහළින් තැලීම් පහරවල් දෙකක් ද දැකගත හැකි වූ අතර ඒවා දම්පාට වී තිබුණි.

අධිකරණ වෛද්‍ය වාර්ථා :

ශෂික කුමාර යන අයගේ වෛද්‍ය වාර්තාව

මෙම පහරදීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවාර්තාවක් කැඳවූ අතර 2023.12.21 දිනැතිව DH/HOM/P/1 අංක යටතේ ශෂික කුමාර යන අය සම්බන්ධයෙන් නිකුත්කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි පහරදීම සම්බන්ධයෙන් වෛද්‍යවරයා වෙත ප්‍රකාශ කර ඇති අතර, රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදෙනු ලබන රෝගී ඉතිහාසයේ "උදෑසන 10 ට කුමාර නැමති නිලධාරියා විසින් කේබල් එකකින් තමාට පහරදුන් බවත්, පරුෂ වචනයෙන් බැනවැදුනු බවත්, අවස්ථා කිහිපයකදී එම නිලධාරියා පහරදුන් බවත්, ඒ හේතුවෙන් තමා බියෙන් සිටි බවත් " දක්වා ඇත.

වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කිරීමෙන් පසු නිරීක්ෂණ ලෙස, රෝගියාගේ වම් අතේ පිටුපස 0.5 cm x 5 cm ප්‍රමාණයේ තැලීම් පහරක් ඇති බව සඳහන් කර ඇත. වෛද්‍යවරයාගේ මතය අනුව සැහැල්ලු නම්‍යශීලී ආයුධයක් භාවිතා කරමින් සිදුකරන ලද බවත් (Caused by application of mild degree blunt force trauma using a light pliable weapon) තුවාල රටාව පහරදීමකට අනුකූල බවත් (Injury pattern is in keeping with an assault) තුවාල ඉතිහාසය ප්‍රකාශය සමග ගැළපෙන බවත් (Dating of the injury is in keeping with the given history) සඳහන් කර තිබේ.

ඉසුරු ලක්ෂිත යන අයගේ වෛද්‍ය වාර්තාව

2023.12.21 දිනැතිව DH/HOM/P/2 අංක යටතේ ඉසුරු ලක්ෂිත යන අය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි කරුණු අනුව, පහරදීම සම්බන්ධයෙන් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝගී ඉතිහාසයට අනුව, "දෙසැම්බර් 16 වන දින කුමාර නිලධාරියා විසින් කේබල් එකකින් තමාට පහරදුන් බවට " දක්වා ඇත. වෛද්‍යවරයාගේ නිරීක්ෂණ අනුව, වෙත ප්‍රකාශ කර ඇති අතර, කොන්දේ පිටුපස දකුණු ප්‍රදේශයේ 0.5 cm x 5 cm ප්‍රමාණයේ තැලීම් පහරවල් දෙකක් ඇති බව සඳහන් කර තිබේ. වෛද්‍යවරයාගේ මතය අනුව සැහැල්ලු නම්‍යශීලී ආයුධයක් භාවිතා කරමින් සිදුකරන ලද බවත් (Caused by application of mild degree blunt force trauma using a light pliable weapon) තුවාල රටාව පහරදීමකට අනුකූල බවත් (Injury pattern is in keeping with an assault) තුවාල ඉතිහාසය ප්‍රකාශය සමග ගැළපෙන බවත් (Dating of the injury is in keeping with the given history) සඳහන් කර තිබේ.

දිමුතු උදාර යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව.

2023.12.21 දිනැතිව DH/HOM/P/3 අංක යටතේ දිමුතු උදාර යන අය සම්බන්ධයෙන් නිකුත්කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි පහරදීම සම්බන්ධයෙන් රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසයට අනුව, "දෙසැම්බර් 16 වන දින දහවල් 12 ට පමණ වාට්ටුවේ සිටියදී කුමාර නිලධාරියා විසින් ආර්. සී. අංශයට කැඳවා, එහිදී පරුෂවචනයෙන් බැණවදිමින් කේබල් එකකින් පහරදුන් බවත්, නිලධාරියාගේ වැළමිට ප්‍රදේශයෙන් තමාගේ පපුවට සහ කොන්දට පහරදුන් බවත්, 2023.11.04 දින බඩ ප්‍රදේශය පුළුස්සන ලද බවත් " ප්‍රකාශ කර ඇත.

වෛද්‍යවරයාගේ නිරීක්ෂණ අනුව, රෝගියාගේ දකුණු අතේ වැළමිට ආසන්නයේ 0.2 cm x 6 cm ප්‍රමාණයේ තැලීම් පහරක් ද, පපුවේ දකුණු පස ඉහළ ප්‍රදේශයේ 0.5 cm x 3 cm ප්‍රමාණයේ තැලීම් පහරක් ද, උදරයේ 0.5 cm x 4 cm ප්‍රමාණයේ කැළලක් ද ඇති බව සඳහන් වේ. වෛද්‍යවරයාගේ මතය අනුව, 1 සහ 2 තුවාල සිදුවී ඇත්තේ මොට ආයුධයකින් පහරදීම මගින් බවත් (Caused by blunt force trauma) 2 තුවාල සිදුවී ඇත්තේ සැහැල්ලු මොට බලයක් යෙදිය හැකි ආයුධයක් භාවිතා කරමින් සිදුකරන ලද බවත් (Caused by application of mild blunt force using a pliable weapon) 3 වන තුවාලය පිළිස්සුම් කැළලක් බවත්, තුවාල රටාව පහරදීමකට අනුකූල බවත් (Injury pattern is in keeping with an assault) සඳහන් කර ඇත.

සුභාෂ් වානක යන අයගේ වෛද්‍ය වාර්තාව.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023.12.19 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී සුභාෂ් වානක යන අයගේ කකුල් දෙකෙහි දණහිසෙන් පහළ කොටසේ තැලීම් තිබූ බවට නිරීක්ෂණය වූ බැවින්, එම අයව ද අධිකරණ වෛද්‍යවරයා වෙත යොමුකරන ලෙසට බන්ධනාගාර අධිකාරී වෙත දැනුම් දෙන ලදි. එබැවින් එම අය ද අධිකරණ වෛද්‍යවරයා වෙත යොමුකර ඇත. ඒ අනුව 2023.12.21 දිනැතිව DH/HOM/P/4 අංක යටතේ සුභාෂ් වානක යන අය සම්බන්ධයෙන් නිකුත්කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදෙනු ලබන රෝග ඉතිහාසයේ දක්වා ඇත්තේ, "මෙම සිදුවීම සම්බන්ධයෙන් තමා කිසිවක් නොදන්නා බවත්, තමා නිදාගෙන සිටි බවත්ය." ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි "රෝගියාගේ පෙනීමට අලුත් තුවාල කිසිවක් නොමැති බවත්, රෝගියා කායික හා මානසික වශයෙන් ස්ථාවර තත්ත්වයේ පසුවන බවත්" සඳහන් කර ඇත.

මේ අනුව පැමිණිල්ලට අදාළ වින්දියන් අතරින් ශෂික කුමාර, දිමුතු උදාර සහ ඉසුරු ලක්ෂිත යන තිදෙනා විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ලබාදෙන ලද ප්‍රකාශයෙහි (බී. රෝගියා විසින් දෙන ලද කෙටි

ඉතිහාසය) බන්ධනාගාර නියාමක කුමාර නිලධාරියා විසින් ඔවුන්ට පහරදුන් බව සඳහන් කර ඇති අතර, එම වින්දිතයන් විසින් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් වෙත ලබාදෙන ලද ප්‍රකාශයන්හි ද එසේ ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :

01. ශෂික කුමාර නැමති වින්දිතයා විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයට අනුව, නියාමක කුමාර නිලධාරියා විසින් පරුෂ වචනයෙන් බැනවදිමින්, කේබල් එකකින් තමාගේ වම් සහ දකුණු අත් දෙකේ වැළමිටෙන් පහළට පහරදුන් බවට දක්වා ඇති අතර, කොමිෂන් සභාව විසින් වින්දිතයා නිරීක්ෂණ කිරීමේදී, එම අයගේ වම් සහ දකුණු වැළමිටෙන් පහළ තැළීම් පවතින බවට නිරීක්ෂණ කර ඇත.

එසේම මෙම වින්දිතයා සම්බන්ධයෙන් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති කරුණු නිරීක්ෂණය කිරීමේදී, අධිකරණ වෛද්‍යවරයා විසින් තුවාල රටාව පහරදීමකට අනුකූල බවත් (Injury pattern is in keeping with an assault) තුවාල රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසය හා සැසඳෙන බවත් (Dating of the injury is in keeping with the given history) දක්වා ඇත. තවද රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසයේ තමාට කුමාර නැමති නිලධාරියා විසින් පහරදීමක් සිදුකළ බවට දක්වා ඇති අතර, එය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයට සමාන ප්‍රකාශයක් බව නිරීක්ෂණය වේ.

ඉහත නිරීක්ෂණ අනුව වින්දිත ශෂික කුමාර යන අයට නියාමක කුමාර නැමති නිලධාරියා විසින් පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වනු ඇත.

02. දිමුතු උදාර නැමති වින්දිත විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයට අනුව, නියාමක කුමාර නිලධාරියා විසින් තමාව ආර්. සී. අංශයට රැගෙන ගොස් පරුෂ වචනයෙන් බැණවදිමින් පොල්ලකින් කොන්දට පහරදුන් බවත්, පපුවේ නාභියට පහළින් සහ දකුණු පස ඉන ප්‍රදේශය යන ස්ථාන දෙකට යකඩ කූරක් රත්කොට තැබූ බවත්, සපත්තු සහිත කකුලෙන් පහරදුන් අතර, එම පහරින් විසිවී ගොස් හිස බිත්තියේ වැදුනු බවත්, බඩට ද පයින් පහරදුන් බවත් දක්වා ඇත. කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් වින්දිතයා නිරීක්ෂණය කිරීමේදී, එම අයගේ නාභිය ප්‍රදේශයට ආසන්නව සහ ඉන ප්‍රදේශයේ පිළිස්සුම් තුවාල දෙකක් නිරීක්ෂණය කොට ඇති අතර, දකුණු පස අතෙහි වැළමිට ප්‍රදේශයේ පිළිස්සුම් තුවාලයක් ද පවතින බවට නිරීක්ෂණය කොට ඇත.

එසේම මෙම වින්දිතයා සම්බන්ධයෙන් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු නිරීක්ෂණය කිරීමේදී, දකුණු අතේ වැළමිට ආසනන්යේ, පපුවේ දකුණු පස ඉහළ කෙලවරේ සහ උදරයේ තුවාල ඇති බවට දක්වා ඇති අතර, තුවාල මොට ආයුධයකින් හා සැහැල්ලු මොට බලයක් යෙදිය හැකි ආයුධයකින් සිදුවිය හැකි තුවාල බවත්, එක් තුවාළයක් පිළිස්සුම් තුවාල කැළලක් බවත්, තුවාල රටාව පහරදීමකට අනුකූල බවත්, තුවාල් රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසය හා සැසඳෙන බවත් දක්වා ඇත. තවද රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති රෝග ඉතිහාසයේ තමාට කුමාර නැමති නිලධාරියා විසින් පහරදීමක් සිදුකළ බවට දක්වා ඇති අතර, එය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයට සමාන ප්‍රකාශයක් බව නිරීක්ෂණය වේ.

ඉහත නිරීක්ෂණ අනුව වින්දිත දිමුතු උදාර යන අයට කුමාර නැමති නිලධාරියා විසින් පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වනු ඇත.

03. ඉසුරු ලක්ෂිත යන අය විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයේ සඳහන් වන්නේ, කුමාර නිලධාරියා විසින් තමාව ආර්. සී. අංශයට කැඳවා කමිසය ගැලවීමට අණ කොට බයිසිකල් ලොක් රඳවන වයරයකින් කොන්දට සහ වම් අතට පහරදුන් බවයි. මෙම වින්දිතයාගේ කොන්දේ පිටුපස ප්‍රදේශයේ පහරදුන් බවට පැවසෙන ආකාරයේ එක් තැලුම් සලකුණක් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් නිරීක්ෂණය කර ඇත.

මෙම අය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවේ ද මෙම පහරදීම නම්‍යශීලී ආයුධයක් භාවිතා කරමින් සිදුකරන ලද්දක් බවත්, තුවාලවල රටාව රෝගියා විසින් පවසනු ලබන පහරදීම් ආකාරය හා අනුකල බවත්, තුවාල රෝග ඉතිහාසය හා සැසඳෙන බවත් සඳහන් කර ඇත. මේ අනුව මෙම වින්දින විසින් ලබාදී ඇති ප්‍රකාශ සහ අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු ද සලකාබැලීමේදී, නියාමක කුමාර නැමති නිලධාරියා විසින් වින්දිත ඉසුරු ලක්ෂිත යන අයට පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වේ.

04. ඉහත වින්දිතයන් තිදෙනා විසින් ලබාදෙන ලද ප්‍රකාශ සහ කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ගේ නිරීක්ෂණ හා අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් නිර්දේශ සමඟ සමාන වේ. 01 වන වගඋත්තර පාර්ශවය විසින් පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කළ ද, අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින්, තුවාල රටාව පහරදීමකට අනුකූල බවත් (Injury pattern is in keeping with an assault) තුවාල ඉතිහාසය ප්‍රකාශය සමඟ සැසඳෙන බවත් (Dating of the injury is in keeping with the given history) සඳහන් කර ඇති බැවින් පහරදීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම වගඋත්තරකරුවන් විසින් වින්දිතයන්ට තුවාල ඇතිවීමට පිළිගත හැකි වෙනත් බාහිර සිදුවීම් ඇතිවූ බවට විත්තිවාචකයන් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය වේ.

05. මෙම සිදුවීමට අදාළ වින්දිතයන් අතුරින් **සුභාෂ් වානක** යන අය 2023.12.19 දින කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් වෙත ලබාදෙන ලද ප්‍රකාශය, 2023.12.21 දින අධිකරණ වෛද්‍යවරයා වෙත ලබාදී නොමැත. තවද මෙම අය විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයේදී, තමාට පහරදුන් බව නියාමක වල්පිට නිලධාරියාට ප්‍රකාශ කර ඇති බවත්, එහිදී වල්පිට නිලධාරියා විසින් බන්ධනාගාර රෝහලේ නිලධාරියෙකු අමතා මේ පිළිබඳව දැනුම්දී ප්‍රතිකාර ලබාදීමට කටයුතු කළ බවත්, ප්‍රතිකාර ලබාදීමට බන්ධනාගාර රෝහලේ නිලධාරියෙකු පැමිණි අවස්ථාවේදී සුභාෂ් විසින් පහරදීම සම්බන්ධයෙන් රෝහලේ නිලධාරියාට ප්‍රකාශ කිරීමට උත්සාහකළ අවස්ථාවේදී, එතැනට පැමිණි නියාමක විතානෝසම් නැමති නිලධාරියා විසින් මෙම පහරදීම සම්බන්ධයෙන් වෙනත් පුද්ගලයෙක්හට ප්‍රකාශ නොකරන ලෙස තර්ජනය කළ බවත් කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ලබාදුන් ප්‍රකාශයෙහි සඳහන් වේ.

එබැවින් මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු විමසීම සඳහා සැරයන් වල්පිට මහතා, නියාමක විතානෝසම් මහතා, බන්ධනාගාර රෝහලේ හෙද නිලධාරී දර්ශනාත් මහතා, බන්ධනාගාර රෝහලේ ඖෂධ සංයෝජක සෙනවිරත්න මහතා යන අය 2024.05.08 දින කොමිෂන් සභාවට කැඳවා ප්‍රකාශ සටහන් කර ගන්නා ලද අතර, එම ප්‍රකාශ මගින් ද සුභාෂ් වානක යන වින්දිතයාට පහරදීමක් සිදුවී ඇති බවට කරුණු සනාථ නොවේ. එදින සුභාෂ් වානක යන අයට ද කැඳවීමක් සිදු කළ නමුත් හේතු දැක්වීමකින් තොරව ඔහු පැමිණ නොමැත.

02 වන වගඋත්තරකරු සම්බන්ධයෙන් සුභාෂ් වානක යන අය විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයේ, නියාමක කුමාර නිලධාරියා තමාට පහරදෙන අවස්ථාවේ ජේලර් රාමනායක නිලධාරියා ද එම ස්ථානයේ සිටි බවට පමණක් ප්‍රකාශ කර ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් ද අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඔහු විසින් කිසිදු කරුණු දැක්වීමක් සිදුකර නොමැත. එසේම උදාර ගුණතිලක යන අය කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයේ, ජේලර් රාමනායක මහතා විසින් තම වම් කම්මුලට තදින් පහරක් එල්ල කර තර්ජනය කළ බව සඳහන් වුවද, අධිකරණ වෛද්‍යවරයා වෙත ලබාදී ඇති ප්‍රකාශයෙහි, නියාමක කුමාර නිලධාරියා පහරදුන් බව පමණක් සඳහන් කර ඇත. තවද ජේලර් රාමනායක නිලධාරියා විසින් පහරදුන් බවට හෝ තර්ජනය කළ බවට අනෙක් වින්දිතයන් වන ශශික කුමාර සහ ඉසුරු ලක්ෂිත යන අය විසින් ප්‍රකාශ කර නොමැත.

06. ඒ අනුව 02 වන වගඋත්තරකරු වන දෙවන පෙළ ජේලර් රාමනායක නිලධාරියා සම්බන්ධයෙන් වන චෝදනාව ප්‍රමාණවත් ලෙස ඔප්පුවී නොමැති බව නිරීක්ෂණය වේ.

07. තවද, වටරැක බන්ධනාගාරයේ තරුණ වරදකරුවන්ට සිදුවන පහරදීම් / හිංසනයන් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්වන තෙක් බන්ධනාගාරය තුළ සිදුවන මෙවැනි

ආකාරයේ හිංසනයන් සම්බන්ධයෙන් බන්ධනාගාර අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලබන, බන්ධනාගාර අධිකාරිවරයාගේ අවධානය යොමුවී නොමැති වීම ද කොමිෂන් සභාවේ අවධානයට ලක් විය.

**නිගමනය :**

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෘෘර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම වගඋත්තරකාර නියාමක පී.ඒ.පී.එස්. කුමාර නිලධාරියා විසින් 2, 3, 4 යන වින්දිතයන් සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

ඉහත නිගමනය අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කර සිටී.

**බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින්,**

01. වගඋත්තර පාර්ශවීය පී.ඒ.පී.අයි. ශානක කුමාර (බන්ධනාගාර නියාමක) නිලධාරියා වෙනත් බන්ධනාගාරයක් වෙත මාරුකර, ඔහු සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු අතර ගත් ක්‍රියා මාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුම්වත් කළයුතු වේ.

02. පළමුවන වගඋත්තරකාර, පී.ඒ.පී.අයි. ශානක කුමාර (බන්ධනාගාර නියාමක) නිලධාරියා විසින් එක් වින්දිතයෙකු වෙත රු.5000/-ක් බැගින් වූ රු.15,000/-ක මුදලක් 02, 03 සහ 04 යන වින්දිතයන් වෙත ලබාදීමට කටයුතු කළ යුතු වේ. අදාළ ගෙවීම් සිදු කර පළමු වගඋත්තරකරු විසින් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු වේ.

03. වටරැක බන්ධනාගාරයේ තරුණ වරදකරුවන්ට සිදුවන පහරදීම්/හිංසනයන් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්වන තෙක් ඒ පිළිබඳව බන්ධනාගාර අධීක්ෂණ නිලධාරියා වශයෙන් බන්ධනාගාර අධිකාරීගේ අවධානය යොමු වී නොමැති අතර, කොමිෂන් සභාවේ සිදුකරන ලද පරීක්ෂණ අතරතුරදී අදාළ පියවර ගැනීමට කටයුතු කරන බවට කොමිෂන් සභාව වෙත දන්වා ඇත. ඒ අනුව, ඉදිරියේදී බන්ධනාගාරය තුළ කිසිදු රැඳවියෙකුට මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට බන්ධනාගාර අධිකාරී විසින් වගබලාගත යුතු බවත්, හිංසනයන්

වැළැක්වීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග විමසීමට ලක් කරමින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් බන්ධනාගාර අධිකාරී වෙත ලිඛිත දැනුම්දීමක් කළයුතු ය.

04. බන්ධනාගාරය තුළ රැඳවියන් වදහිංසාවට ලක්වීම වැළැක්වීම සඳහා අවශ්‍ය හා සුදුසු පියවර ගැනීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් ද සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතු ය.

2024. 07 . 04 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත සහ බන්ධනාගාර අධිකාරී වෙත මෙයින් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නො - 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

02. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, - ඉහත නිර්දේශය ප්‍රකාරව පියවර ගැනීමට
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 08.

B/